# 09

# රෝග වළක්වා ගනිමු

**විදුහල්පති තුමා**

සියලු දෙනාට ම සුබ උදෑසනක්. මෙම රැස්වීම අද මම කැඳෙව්වේ ගියවර රැස් වූ අවස්ථාවේ අප ගත් තීරණ කොතෙක් දුරට ක්‍රියාත්මක මට්ටමේ පවතිනවා ද කියා කතාබහ කිරීමටයි. අපත් ඇතුළු අපේ ප්‍රදේශවාසීන් මදුරු උවදුරෙන් විශාල වශයෙන් පීඩා විඳිනවා. මෙය මර්දනය සඳහා අපට කළ හැකි කාර්යයන් කිහිපයක් ගැන අප එකඟතාවකට ආවා නේ ද?

**නියෝජ්‍ය විදුහල්පති තුමා**

ඔව්, විදුහල්පතිතුමා, එහි දී

- ඩෙංගු මර්දන දිනයක් පැවැත්වීම,
- ප්‍රදේශවාසීන්ට මදුරු දැල් සහන මිලට ලබා ගැනීමට කටයුතු කිරීම,
- ප්‍රදේශය පුරා මදුරු නාශක බෙහෙත් දියර ඉසීම,
- ප්‍රදේශවාසින් හා දරුවන් දැනුවත් කිරීම සඳහා කථික තරගයක් පැවැත්වීම,

යන කරුණු ගැන සාකච්ඡා කළා. එම සංවිධායක කමිටුව භාර ව ක්‍රියා කරන්නේ පෙරේරා ගුරු මහත්මියයි.

**පෙරේරා ගුරු මහත්මිය** විදුහල්පතිතුමා, ඒ සම්බන්ධ සියලු වැඩ කටයුතු සකස් කර අවසානයි.

**විදුහල්පති තුමා** මදුරු දැල් සහන මිලට ලබා ගැනීම සඳහා දර්ශන කර්මාන්තායතනයට යැවීමට ලිපියක් සකස් කළා ද?

**පෙරේරා ගුරු මහත්මිය** ඔව්, මේ තියෙන්නේ ඒ ලිපිය. සංවිධායක කමිටුවේ ලේකම් ඒ ලිපිය සකස් කර තිබුණා.

සිරි සුමන විදුහල,
කළුතර.
2011. 04. 19

අලෙවි කළමනාකාරතුමා,
දර්ශන කර්මාන්තායතනය,
දළුගම,
කැලණිය.

ප්‍රිය මහත්මාණෙනි,

**මදුරු දැල් සහන මිලට ලබාගැනීම**

මේ දිනවල අප ප්‍රදේශයේ මදුරු උවදුර දැඩි ලෙස පැතිරෙමින් පවතී. මේ නිසා ප්‍රදේශවාසීහු ඩෙංගු, මැලේරියා වැනි වසංගත රෝග පිළිබඳ ව මහත් බියෙන් පසු වෙති.

අප පාසල විසින් ඩෙංගු මර්දන දිනයක් පැවැත්වීමට අදහස් කර ඇත. එදින ප්‍රදේශවාසීන්ට සහන මිලට මදුරු දැල් ලබාදීමට අපි බලාපොරොත්තු වෙමු.

ඔබ ආයතනයෙන් සහන මිලට මදුරු දැල් ලබා දෙන්නේ නම් එය අපට විශාල උපකාරයක් වනු ඇත. ඔබ ආයතනයෙන් අපට ලබා දිය හැකි මදුරු දැල් ප්‍රමාණය හා මිල ගණන් ඉහත සඳහන් ලිපිනයට අප වෙත එවන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී,

..........................................
(රුසිරු යසස්)
සංවිධායක ලේකම්
ඩෙංගු මර්දන ව්‍යාපෘතිය

**විදුහල්පති තුමා** මදුරු නාශක බෙහෙත් ලබා ගැනීමට මහජන සෞඛ්‍ය පරික්ෂකතුමාට ලිපියක් සකස් කළා ද?

**පෙරේරා ගුරුතුමිය** ඔව්, විදුහල්පතිතුමා ඒ ලිපිය මා ළඟ තියෙනවා.

සිරි සුමන විදුහල,
කළුතර.
2011.04.15

මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා,
මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය,
කළුතර.

ප්‍රිය මහත්මාණෙනි,

**මදුරු උවදුර මර්දනය කිරීම**

කළුතර නගර සභා සීමාව තුළ අධික ලෙස මදුරුවන් බෝවීම නිසා ප්‍රදේශවාසීහු දැඩි ලෙස පීඩාවට පත් ව සිටිති. මේ නිසා මදුරුවන්ගෙන් බෝවෙන ඩෙංගු මැලේරියා වැනි වසංගත රෝග පැතිරීමට ද ඉඩ ඇත.

එබැවින් කරුණාකර, මේ ප්‍රදේශයට මදුරු මර්දන බෙහෙත් ඉසීම සඳහා අවශ්‍ය කටයුතු කරන මෙන් ප්‍රදේශවාසීන් වෙනුවෙන් ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී,

...........................
(රුසිරු යසස්,)
සංවිධායක ලේකම්
(ඩෙංගු මර්දන ව්‍යාපෘතිය)

**විදුහල්පති තුමා** : හොඳයි. නියෝජ්‍ය විදුහල්පතිතුමනි, ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා පැවැත්වීමට තීරණය කළ රැස්වීමේ වැඩ පිළිවෙළ කොහොම ද?

**නියෝජ්‍ය විදුහල්පති තුමා** : ඒක කථික තරගයක් විධියට පැවැත්වීමට තීරණය කළා. ඒ පිළිබඳ ව විස්තර ඇතුළත් දැන්වීමකුයි අයදුම්පත් ආකෘතියකුයි සකස් කර තිබෙනවා. එහි පිටපතකුයි මේ තියෙන්නේ.



## ඩෙංගු මර්දන දිනය වෙනුවෙන් කථික තරගයක්

අප විද්‍යාලයේ පැවැත්වීමට අපේක්ෂිත ඩෙංගු මර්දන දිනය වෙනුවෙන් විදුහලේ සිසුන් අතර කථික තරගයක් ද පැවැත්වීමට තීරණය කර ඇත.

ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

- වයස් කාණ්ඩ තුනකි.
  - අවුරුදු 9 සිට 11 දක්වා
  - අවුරුදු 12 සිට 14 දක්වා
  - අවුරුදු 15 සිට 17 දක්වා
- කාලය - විනාඩි 05 කි.
- මාතෘකාව - මදුරු උවදුර
- කතාවට ඇතුළත් විය යුතු කරුණු
  - මදුරු උවදුර ඇතිවීමට බලපාන හේතු
  - මදුරු උවදුරෙන් වන හානි
  - මදුරු උවදුරෙන් වැළකී සිටීමට ගත හැකි පියවර
  - මදුරු උවදුර මර්දනය කළ හැක්කේ කෙසේ ද?
- ස්ථානය :- විද්‍යාලයීය ප්‍රධාන ශාලාව
- තරග පැවැත්වෙන දිනය :- 2011.05.30

කථික තරගයට ඉදිරිපත් වීමට කැමති සිසුන් පහත දැක්වෙන ඉල්ලුම්පත සම්පූර්ණකොට පන්ති භාර ගුරු මහතා හෝ ගුරු මහත්මිය මගින් 2011.05.08 දිනට පෙර ඩෙංගු මර්දන ව්‍යාපෘති කමිටුවේ ලේකම් වෙත ලැබෙන්නට සලස්වන්න.

දිනය:-2011.04.20 ලේකම්

ඩෙංගු මර්දන ව්‍යාපෘතිය

සිරි සුමන විදුහල

## කථික තරගය සඳහා අයදුම්පත

1. මුල'කුරු සමග අගට යෙදෙන නම : ................................................

2. මුල'කුරුවලින් හැඳින්වෙන නම් : ......................................................

3. උපන් දිනය : .......................................................

4. අයදුම්පත ඉදිරිපත් කරන දිනට වයස :
   අවුරුදු ..................... මාස .................. දින ........................

5. ස්ත්‍රී / පුරුෂ භාවය : ................................................

6. ඉගෙනුම ලබන ශ්‍රේණිය : ................................................

7. ශ්‍රේණිභාර ගුරු මහතාගේ / මහත්මියගේ නම
   : ................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

..........................................

දිනය .............................. අයදුම්කරුගේ අත්සන

**ශ්‍රේණි භාර ගුරු මහතා / මහත්මියගේ නිර්දේශය**

............................................................................................................. නමැති ශිෂ්‍යයා / ශිෂ්‍යාව මාගේ භාරකාරත්වය යටතේ ................................................ ශ්‍රේණියේ ඉගෙන ගන්නා බව සහතික කරමි.

.....................................................................................

ශ්‍රේණි භාර ගුරු මහතා / මහත්මියගේ අත්සන

දිනය : ..............................

විදුහල්පතිතුමා : මට පේන්නේ අප නියම කරගත් කටයුතු බොහෝ දුරට අවසන් වී ඇති බවයි. ලිපි අදාළ ආයතනවලට යවන්න. කරීක තරගයට ඉල්ලුම්පත් භාර ගන්න. සති දෙකකින් එළඹෙන බ්‍රහස්පතින්දා පෙ.ව. 11.00 ට අපි හමුවෙමු. අද සහභාගිත්වය වෙනුවෙන් ඔබ සැමට ස්තුතියි.

# ක්‍රියාකාරකම්

01). පහත දැක්වෙන්නේ ව්‍යාපාරික ලියුමක සැලැස්මකි. එහි අංක යොදා ඇති ස්ථානවල ලිවිය යුත්තේ කුමක් ද යන්න වරහන් තුළින් තෝරා අංක ඉදිරියෙන් ලියන්න.

(1) ..........................................
..........................................
..........................................
(2) ..........................................

(3) ..........................................
(4) ..........................................
..........................................
..........................................
(5) ..........................................

(6) ..........................................................................

(7) .............................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

(8) ........................
........................
(9) ....................................

( ආමන්ත්‍රණය, ලියුම ලබන්නාගේ ලිපිනය, මාතෘකාව, තනතුර, ලියුම ලියන්නාගේ ලිපිනය, ලියුම ලියන්නාගේ නම, තනතුර, කරුණු , අත්සන, දිනය, අවසානය )

**පැවරුම්**

01). ඔබේ ගෙවත්තේ හෝ පාසලේ ගොවිපොළේ වගා කිරීමට අවශ්‍ය බීජ වර්ග ගෙන්වා ගැනීම සඳහා ගන්නොරුව කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ අලෙවි කළමනාකාරතුමා වෙත යැවීම සඳහා ලියුමක් ලියන්න.

02). මෙවර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ ආදර්ශ ප්‍රශ්න පත්‍ර කට්ටලයක් ඉල්ලා පොත් සමාගමක අලෙවි කළමනාකරු වෙත යැවීම පිණිස ලියුමක් ලියන්න.

03). පාසල් බස්රථයක් යොදවන ලෙස ඉල්ලා ඔබේ ප්‍රදේශයේ ලං.ග.ම. ඩිපෝවේ කළමනාකාරතුමා වෙත යැවීමට ලියුමක් ලියන්න.

04). අධ්‍යාපන චාරිකාවක් යාමට අවසර ඉල්ලා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත යැවීමට ලියුමක් ලියන්න.

05). ග්‍රහලෝකාගාරය නැරඹීමට දිනයක් වෙන් කර දෙන ලෙස ඉල්ලා කොළඹ 07, ස්ටැන්ලි විජේසුන්දර මාවතේ පිහිටි ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයේ අධ්‍යක්ෂතුමා වෙත යැවීම පිණිස ලියුමක් ලියන්න.

06). පහත සඳහන් ලියුමට පිළිතුර වශයෙන් ලියුමක් ලියන්න.

මගේ අංකය සා.සේ./1.
2008 07 19,
ප්‍රාදේශීය විදුලි සංදේශ
කාර්යාලය,
කළුතර.

ලේකම්තුමා,
ග්‍රාම සංවර්ධන සමිතිය,
මිරිස්වත්ත,
කළුතර.

මහත්මාණෙනි,

**දුරකථන පහසුකම් ලබා දීම**

2008.06.21 දින දරන ඔබගේ ලිපිය හා බැඳේ.

ඔබ විසින් ඉල්ලා ඇති පරිදි ඔබගේ ග්‍රාම සංවර්ධන කාර්යාලයට දුරකථන පහසුකම් ලබා දීම සඳහා පහත සඳහන් තොරතුරු මෙමම කාර්යාලයට නොපමාව ලැබීමට සලස්වන්න.

1. මධ්‍යස්ථානයේ නමඃ
2. ලිපිනය ඃ
3. අවශ්‍ය දුරකථන සංඛ්‍යාවඃ

මෙයට,
විශ්වාසි,

.........................................................
නිශාන්ත මුණසිංහ
ප්‍රාදේශීය විදුලි සංදේශ කළමනාකරු

07). පහත දැක්වෙන පුවත්පත් දැන්වීමේ සඳහන් වන රැකියාවට අයදුම් කිරීම සඳහා ඉල්ලුම්පතක් පිළියෙල කරන්න.

**තානාපති කාර්යාලයක**
**දුරකථන ක්‍රියාකරු තනතුර**

ප්‍රධාන පෙළේ තානාපති කාර්යාලයක සේවය සඳහා දුරකථන ක්‍රියාකරුවකු අවශ්‍ය වේ. අයදුම්කරු දුරකථන පාලන පුවරුව ක්‍රියා කරවීම හා ෆැක්ස් සේවා සැපයීමේ වගකීම දැරිය යුතු වේ.

පහත සඳහන් සුදුසුකම් සවිස්තරාත්මක ව ඇතුළත් වන පරිදි සැකසූ අයදුම් පත අදාළ අධ්‍යාපන හා සේවා සහතික පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතු අතර, එලෙස සම්පූර්ණ නොකළ අයදුම් පත් නොසලකා හරින බව කරුණාවෙන් සලකන්න.

- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත්ව,
- දුරකථන හා ෆැක්ස් සේවා පහසුකම් සැපයීමෙහි සේවා පළපුරුද්ද,
- මූලික දුරකථන භාවිතයන් හා ක්‍රියාකාරකම් පිළිබඳ ව මනා දැනුම,
- ඊමේල්, ස්ප්‍රෙඩ් ෂීට්, වර්ඩ් ප්‍රොසෙසින් සම්බන්ධ පරිගණක කුසලතා,
- ඉංග්‍රීසි හා සිංහල භාෂාවන්හි මනා ව්‍යවහාරික දැනුම,
- පාරිභෝගික සේවාවන් සැපයීමේ කුසලතාව,

දුරකථන අංකයත් සහිත සම්පූර්ණ කරන ලද අයදුම්පත් මානව සම්පත් කාර්යාලය, තැ.පෙ.106, කොළඹ යන ලිපිනයට මාර්තු මස 29, 2008 දිනට පෙර ලැබීමට සලස්වන්න.
ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කරන්න.

ඔබගේ තොරතුරු ඇසුරෙන් ඔබ පිළියෙල කළ ඉල්ලුම් පත සම්පූර්ණ කරන්න.

08). එදිනෙදා පුවත්පත්වල පළ වී ඇති රැකියා පුරප්පාඩු පිළිබඳ දැන්වීම් කිහිපයක් තෝරා ගෙන ඉල්ලුම් පත්‍රයක් පිළියෙල කරන්න.